# 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.
# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර.

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට 2021 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයීම පිණිස ලියාපදිංචි කිරීමට අපේක්ෂිත සුදුසුකම්ලත් සැපයුම්කරුවන්, නිෂ්පාදකයින් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම**

**I වන කොටස**

| අනු අංකය | භාණ්ඩ - විස්තරය | | |
|---|---|---|---|
| G - 1 | කාර්යාලීය හා පාසල් උපකරණ | G - 13 | පොදු හා ගෘහ භාණ්ඩ |
| G - 2 | කාර්යාලීය උපකරණ | G - 14 | අධ්‍යාපනික උපකරණ |
| G - 3 | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය හා ලිවීමේ උපකරණ | G - 15 | ක්‍රීඩා උපකරණ |
| G - 4 | පොත්පත් හා සඟරා | G - 16 | සංගීත භාණ්ඩ |
| G - 5 | ගොඩනැගිලි ද්‍රව්‍ය | G - 17 | කෘෂි උපකරණ |
| G - 6 | ගොඩනැගිලි වෙන් කිරීම් (Partitioning) හා මෝස්තර | G - 18 | පොහොර වර්ග හා කෘෂි රසායනික ද්‍රව්‍ය |
| G - 7 | විදුලි උපාංග හා සවිකිරීම් | G - 19 | කෘෂි බීජ හා වෙනත් පැල වර්ග, පැල සිටුවීමේ අමුද්‍රව්‍ය |
| G - 8 | පරිගණක යන්ත්‍ර හා උපාංග | G - 20 | සත්ත්ව ආහාර, සත්ත්ව ඖෂධ හා වෙනත් |
| G - 9 | සමාජ සුභසාධන උපකරණ | G - 21 | කුඩා කර්මාන්තය සඳහා වූ අමුද්‍රව්‍ය (නූල්, සායම් හා වෙනත්) |
| G - 10 | විදුලි උපකරණ | G - 22 | සත්ත්ව හා සත්ත්ව උපකරණ |
| G - 11 | සන්නිවේදන උපකරණ | G - 23 | ධීවර ආම්පන්න |
| G - 12 | මෝටර් රථ අමතර කොටස් | | |

| අනු අංකය | සේවා - විස්තරය |
|---|---|
| S - 1 | ලිපි ශීර්ෂ පොත්, ප්‍රකාශන මුද්‍රණය කිරීම, පෝස්ටර් හා බැනර් මුද්‍රණය කිරීම, නාම පුවරු, සංකේත ලැලිවල අකුරු සවි කිරීම, පොත් බැඳීම, මෝස්තර කැපීම (Block) රබර් මුද්‍රා සකස් කිරීම. |
| S - 2 | කාර්යාලීය හා පාසල් උපකරණ අළුත්වැඩියා කිරීම. |
| S - 3 | කාර්යාලීය ඡායා පිටපත් යන්ත්‍ර, යතුරු ලියන, පිටපත් කිරීමේ යන්ත්‍ර හා අනෙකුත් විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම. |
| S - 4 | පරිගණක යන්ත්‍ර සහ ප්‍රින්ටර් අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම. |
| S - 5 | වායු සමීකරණ, විදුලි උපකරණ හා විදුලි වයර් අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම. |
| S - 6 | ආරක්ෂක සේවා සැපයීම. |
| S - 7 | සනීපාරක්ෂක සේවා සැපයීම, ගොඩනැගිලි භූමිය, දොරවල්, ජනෙල් හා තිර රෙදි පිරිසිදු කිරීම. |
| S - 8 | **වාහන අළුත්වැඩියා :-** යාන්ත්‍රික විදුලි උපකරණ (Circuit) අළුත්වැඩියා කිරීම, තහඩු (Tinkering) අළුත්වැඩියා කිරීම, පින්තාරු කිරීම, ඩීසල් වාහන පෙට්‍රල් වාහන අළුත්වැඩියා කිරීම, වායු සමීකරණ සවි කිරීම හා අළුත්වැඩියා කිරීම, වාහන අසුන් කුෂන් කිරීම සහ කවර දැමීම. |
| S - 9 | **වාහන නඩත්තු කිරීම :-** කාලසටහන අනුව නවීකරණය කිරීම, රෝදවල ක්‍රියාකාරීත්වය (alignment) පරීක්ෂා කිරීම, රෝද සම කිරීම, ටයර් මාරු කිරීම, වාහනය ඇතුළත නවීකරණය හා අලංකාර කිරීම. |
| S - 10 | වාහන හා ඉදිකිරීම් සේවා යන්ත්‍ර සූත්‍ර කුලියට දීම හෝ බද්දට දීම. |
| S - 11 | වෙනත් සේවා - පිසින ලද ආහාර හා රසකැවිලි වර්ග, ඉහත සඳහන් නොවන සේවා |
| S - 12 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය - වාර්තා චිත්‍රපටි, වෙබ් අඩවි සංවර්ධනය |

II වන කොටස

## කොන්ත්‍රාත්කරුවන් ලියාපංදිංචි කිරීම.
## කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය සුදුසුකම්.

01. CIDA ආයතනයේ ඉදිකිරීම් කටයුතු සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් රු.10,000,000/= (රුපියල් මිලියන දහය) දක්වා වන සුළු පරිමාණයේ කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි කර ගැනීමට සුදුසුකම් ලබයි. තවද ලියාපදිංචි සමිති 2,000,000/= (රුපියල් මිලියන දෙක) දක්වා වන කොන්ත්‍රාත් වැඩ කිරීමට සුදුසුකම් ලබයි.

02. සුදුසුකම් හා වත්කම් සනාථ කරන්නාවූ ලිඛිත සාක්ෂීන් ඉදිරිපත් කළ යුතුය. (ඒවායේ පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුයි.)

03. සිවිල් ඉංජිනේරු වැඩකටයුතු හසුරුවා ගැනීමේ සුදුසුකම් ස්ථිරකර ගෙන ඇතොත් එය සනාථ කිරීමට හැකි ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි. (ඒවායේ පිටපත් අයදුම්පත්‍රය සමඟ ඇමිණිය යුතුයි.)

04. ඉදිකිරීම් වැඩ සඳහා ලියාපදිංචි කර ගැනීමට අපේක්ෂිත කොන්ත්‍රාත්කරුවන් ආපසු ගෙවනු නොලබන තැන්පත් මුදල **“දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර”** නමින් ඇති ලංකා බැංකුවේ අම්පාර ශාඛාවේ අංක **7042024** දරණ ගිණුමට බැර කළ යුතුය. බැංකුවට ගෙවන ලද මුදල් තැන්පත් කුවිතාන්සිය අයදුම්පත සමඟ අමුණා **“දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,අම්පාර”** යන ලිපිනයට 2020-12-20 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **“2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම”** යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත්‍රය සහ ලියාපදිංචිය - ලියාපදිංචි කිරීම සඳහා ආපසු ගෙවනු නොලබන පහත සඳහන් මුදල ඉහත සඳහන් ගිණුමට තැන්පත් කර පූර්ව සුදුසුකම් (Per - Qualication) සනාථ කිරීමේ ආකෘති පත්‍රය සමඟ එම කුවිතාන්සිය අමුණා එවිය යුතුය.

| කොන්ත්‍රාත් මුදල | ගාස්තුව |
|---|---|
| කොන්ත්‍රාත් මුදල රු. මිලියන දෙක හෝ ඊට අඩු මුදල් සඳහා | රු. 2000/= |
| කොන්ත්‍රාත් මුදල රු. මිලියන දෙකට වඩා වැඩි සහ රු. මිලියන පහ හෝ ඊට අඩු මුදල් සඳහා | රු. 3000/= |
| කොන්ත්‍රාත් මුදල රු. මිලියන පහට වඩා වැඩි සහ රු. මිලියන දහය හෝ ඊට අඩු මුදල් සඳහා | රු. 3000/= |

**සාමාන්‍ය කොන්දේසි :-**
**සැපැයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියකියවිලි.**

1) **අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.**
   a. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත.
   b. සමාගම් ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත.
   c. ආහාර සැපයුම් සේවාවක් නම්, අදාළ ප්‍රදේශයේ PHI / MOH කාර්යාලයෙන් ලබාගත් සහතිකයේ පිටපත.
   d. අදාළ ව්‍යාපාරය පිළිබඳ පළපුරුදු හා ප්‍රදාන පාරිභෝගිකයින් පිළිබඳ විස්තර.
   e. වාහන අලුත්වැඩියා සහ සේවා සපයන ආයතන ලියාපදිංචි වීමේදී අම්පාර ප්‍රධාන මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය සහිත ලිපිය

2) මෙම සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2021 වර්ෂයට පමණක් වලංගුවේ. සාමාන්‍යයෙන් ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. නමුත් වෙනත් අයගෙන් ද මිල ගණන් කැඳවීමේ හිමිකම් මිලදී ගන්නා අයට ඇත.

3) අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති තොරතුරුවල යම් වරදක් තිබේ නම්, එවැනි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4) ලබා ගන්නා අයදුම්පත්‍රය හේතු සාධක ඉදිරිපත් කිරීමකින් තොරව පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ දිස්ත්‍රික් ලේකම්ට හිමිකම් ඇත.

5) ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් මිල ගණන් කැඳවන විට, එය නොසලකා හැරියහොත් හෝ වැඩ අවසන් නොකරන්නේ නම් හෝ ලබා දී ආදර්ශ හෝ කොන්දේසිවලට එකඟ නොවන්නේ නම් හෝ එවැනි සැපයුම්කරුවන් / කෝන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් ඉදිරි අනාගතයේදී මිල ගණන් කැඳවන විට සලකා බලනු නොලැබේ.

6) ව්‍යාපාර ලියාපදිංචි කර ඇති ස්වභාවය හෝ ඊට අදාළ භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කරගත හැක.

7) ලියාපදිංචි සමිතිවලට රු.2,000,000/= (රුපියල් මිලියන දෙකක) උපරිමයට යටත් කොන්ත්‍රාත් වැඩ, පොදු මුදල් චක්‍රලේඛ අංක : 01/2012 ට අනුව ලබාගත හැක.

8) වාහන පිරිසිදු කිරීමේ හා නඩත්තු සේවා සඳහා ලියාපදිංචි කරන සැපයුම්කරුවන්, අවශ්‍ය මූලික උපකරණ හා පහසුකම් සනාථ කිරීමේ විස්තර අයදුම්පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුයි.

9) සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් කිසිවක් ගෙවනු නොලැබේ.

10) ලියාපදිංචි කිරීම සඳහා වූ අයදුම්පත් සියල්ල දෙන ලද ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සකස් කොට හෝ අපගේ අන්තර්ජාලයෙන් හෝ මුද්‍රා තබන ලද තම ලිපිනය ලියූ ලිපි කවරයේ බහා එවීම මඟින් හෝ ලබාගත හැක. ආපසු ගෙවනු නොලබන තැන්පත් මුදල **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර"** නමින් ඇති **ලංකා බැංකුවේ අම්පාර ශාඛාවේ අංක 7042024** දරණ ගිණුමට බැර කළ යුතුය. බැංකුවට ගෙවන ලද මුදල් තැන්පත් කුවිතාන්සිය අයදුම්පත සමඟ අමුණා **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර"** යන ලිපිනයට **2020-12-20** දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුයි. ඉල්ලුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කොට **ලියාපදිංචි** තැපෑලෙන් එවිය යුතුය.

11) ලියාපදිංචි කර ගැනීම සඳහා අපේක්ෂිත සැපයුම්කරුවන් සෑම භාණ්ඩයකට හෝ සේවාවකටම ආපසු ගෙවනු නොලබන තැන්පත් මුදල ලෙස **රු.500/=** ක මුදලක් **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර"** නමින් ඇති **ලංකා බැංකුවේ අම්පාර ශාඛාවේ අංක 7042024** දරණ ගිණුමට බැර කළ යුතුය.. බැංකුවට ගෙවන ලද මුදල් තැන්පත් කුවිතාන්සිය අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

12) 2020-12-20 දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13) වැඩිදුර විස්තර සඳහා www.ampara.dist.gov.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ "දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර" කාර්යාලයේ දුරකථන අංක 063-2222037 ට ඇමතීමෙන් හෝ ලබාගත හැක.

**<u>ආදර්ශ අයදුම්පත්‍රය.</u>**

**<u>2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.</u>**

**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- අම්පාර</u>**

1. ව්‍යාපාරික ආයතනයේ නම :-
2. ව්‍යාපාරික ආයතනයේ ලිපිනය :-
3. දුරකථන අංකය :-
4. ෆැක්ස් අංකය :-
5. ව්‍යාපාරය ලියාපදිංචි අංකය :-
   (පිටපත අමුණා තිබිය යුතුයි)
6. ව්‍යාපාරයේ ස්වභාවය :-
7. ලියාපදිංචි කළයුතු භාණ්ඩ/ සේවා කට්ටල :-

| අයිතමයන් | භාණ්ඩ / සේවා විස්තර |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

8. බැංකුකරුවන්ගේ නම් :-
9. ණය පහසුකම් ලබාදීමේ කාලසීමාව :-
10. සැපැයුම් කළ හැකි දිස්ත්‍රික්කවල නම් :-
11. වැට් (VAT) බදු ලියාපදිංචි අංකය (තිබේ නම්) :-
12. විද්‍යුත් තැපැල් (ඊ මේල්) ලිපිනය :-

මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවත්, අම්පාර දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කර ඇති කොන්දේසිවලට යටත්ව භාණ්ඩ/සේවා සපයන බවත් මෙයින් සහතික කරමි. ලියාපදිංචි ගාස්තුව සඳහා රු...................... ක මුදලක් ......................... දින මහජන බැංකු ශාඛාවේ තැන්පත් කර එම මුදල් තැන්පත් කුවිතාන්සිය මේ සමඟ අමුණා එවමි.

| ..................................... | ......................................... | .............................. |
|---|---|---|
| අයදුම්කරුගේ අත්සන | නම | දිනය |

(නිල මුද්‍රව)